**"නීල හරිත යුගයක් - තිරසර සංවර්ධනයක්"**

# පාරිසරික පෝස්ටර් චිත්‍ර තරගය - 2017



2017 ඔක්තෝබර් මස 16 සිට 18 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වෙන ජනාධිපති පරිසර සම්මාන උළෙලට සමගාමීව "නීල හරිත යුගයක් - තිරසර සංවර්ධනයක්" මැයෙන් දිවයිනේ පාසල් දරුවන් හා විවෘත තරගකරුවන් සඳහා වන පෝස්ටර් චිත්‍ර තරගය ජාතික මට්ටමින් සංවිධානය කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් කටයුතු යොදා ඇත.

**මෙම තරගයේ අරමුණු වන්නේ තරග තේමාවට අදාළව පාසල් දරුවන් ඇතුළු ප්‍රජාවගේ දැනුම, අවබෝධය ඇති කරමින් පාරිසරික සංවේදීතාව වඩවාලීමයි.**

අදාළ විස්තර පහත දක්වා ඇති අතර, තරග කොන්දේසිවලට අදාළව තරගකරුවන්ට
මෙම තරගය සඳහා ඉදිරිපත් විය හැකිය.

## තරග කොන්දේසි

- මෙම තරගය දිවයිනේ සියලුම පාසල් සඳහා විවෘත අතර **"නීල හරිත යුගයක් - තිරසර සංවර්ධනයක්"** යන තේමාව යටතේ චිත්‍ර නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.
- මෙම තරගය කාණ්ඩ තුනකි.
  (A) 9 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා කාණ්ඩය
  (B) 12 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා කාණ්ඩය
  (C) විවෘත කාණ්ඩය



- පෝස්ටර් චිත්‍ර නිර්මාණ මාධ්‍ය පැස්ටල් හෝ දියසායම් විය යුතුය.
- 20"×16" ප්‍රමාණයේ සුදු බ්‍රිස්ටල් බෝඩ් භාවිතා කළ යුතුය.
- පළාත් හා ජාතික මට්ටමින් 1,2,3 ස්ථාන තේරීම සිදු කෙරේ.
- කාණ්ඩ තුනෙන්ම 1,2,3 ස්ථාන ඇතුළුව හොඳම නිර්මාණ ඔක්තෝම්බර් බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වෙන ජනාධිපති පරිසර සම්මාන උළෙලට සමගාමීව ප්‍රදර්ශනය කරනු ලැබේ.
- නිර්මාණ යොමු කිරීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, පෞද්ගලික ලිපිනය, දුරකතන අංක, පාසලේ නම හා ලිපිනය, ඉගෙනුම ලබන ශ්‍රේණිය, තරග කාණ්ඩය, අධ්‍යාපන කොට්ඨාසය, අධ්‍යාපන කලාපය, පළාත් අධ්‍යාපන කාර්යාලය හා දිස්ත්‍රික්කය යන විස්තර සමඟ පෝස්ටර් චිත්‍ර නිර්මාණය තමාගේම නිර්මාණයක් බවට පන්ති භාර ආචාර්යවරයා සහ විදුහල්පති විසින් චිත්‍රයේ පිටුපස සහතික කර එවිය යුතුය. එම චිත්‍ර ආරක්ෂා සහිතව නිර්මාණ භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර මෙම දැන්වීමේ අවසානයේ සඳහන් ලිපිනයට තැපැල් මඟින් හෝ ගෙනවිත් භාරදිය හැකිය.
- පෝසටර් චිත්‍ර නිර්මාණය තුළින් තේමාවට අදාළ පණිවිඩය පිළිබිඹු විය යුතුය.
- පෝසටර් චිත්‍ර නිර්මාණය සඳහා අවශ්‍යනම් සුදුසු වැකියක් / උද්‍යෘතයක් ඇතුළත් කළ හැකිය.
- පෝසටර් චිත්‍ර භාරගන්නා අවසාන දිනය 2017/06/30 වේ.
- නිර්මාණ බහාලන ඇසුරුමේ වම්පස **" පාරිසරික පෝස්ටර් චිත්‍ර තරගය 2017"** යනුවෙන් සදහන් කළ යුතුවේ.

## පොදු කොන්දේසි

- ජයග්‍රාහකයින් සඳහා මුදල් ත්‍යාග හා සහතික ප්‍රදානය කෙරේ.
- විෂය ප්‍රවීණ විද්වත් විනිශ්චය මණ්ඩලයක් විසින් සෑම තරගයකම විනිශ්චය කරනු ලබන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස සලකනු ලැබේ.
- තරගයට අදාළ වැඩිදුර විස්තර www.cea.lk වෙබ් අඩවියෙන් හෝ 011-2876642 දුරකතන අංකයෙන් ද ලබාගත හැකිය.

පෝසටර් චිත්‍ර නිර්මාණ යොමු කළ යුතු ලිපිනය

**සභාපති**
**මධ්‍යම පරිසර අධිකාරිය**
**104 පරිසර පියස, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල**

**මධ්‍යම පරිසර අධිකාරිය**